සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2014/2015 වර්ෂය සඳහා කෑගල්ල අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය මෙම ගැසට් අංකය හා එයට අදාළ පළ කරන දිනය යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,906 - 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2015.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 8 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7 - B 80928 - 302 (2015/03)
E -1

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/30928.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :අනු/11/4/2/07/01 (2009).

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පැරකුම්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රාජාංගනය වම් ඉවුර යාය 03 පැරකුම්පුර ගමේ අ. ජ. පි. කු. 10 පිඹුරෙහි කැබලි අංක 276 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.039ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා ජේ. පී. ඉන්ද්‍රාණි ජයලත් මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. හු. පි. 18 හි කැබලි අංක 775 සහ 275 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 275 සහ 282 ; |
| *දකුණට* | : | කැබලි අංක 282 සහ 277 ඉඩම ; |
| *බටහිරට* | : | කැබලි අංක 277 සහ අ. හු. පි. 18 හි කැබලි අංක 775. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (1995.06.15 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 1995 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*දඩ මුදල* .- 1995 වර්ෂයේ ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2014.11.21 වැනි දින සිට වසර පහක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 පෙබරවාරි මස 19 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලයේ අංක 1200/6, හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-284

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/40345.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/2/SLO/45 - (CER).

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පොන්නගර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අරවියල්නගර් ගමේ අංක KR/LB/CEA/2012 දරන පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 1/2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර ; |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම ; |
| *දකුණට* | : | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ; |
| *බටහිරට* | : | පොල් වගා කිරීමේ මණ්ඩලය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(ආ)* *බදු කාලය .-* අවුරුදු තිහයි (30) (2015.02.19 සිට 2045.02.18 දක්වා);

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ 2015 වර්ෂයේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල කලින් තිබූ ප්‍රමාණයෙන් 50% ප්‍රමාණයකට අඩු නොවන සේ අවුරුදු පහකට වරක් සංශෝධනය විය යුතු ය.

*වාර මුදල .-* වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

*01.* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*02.* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*03.* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*04.* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*05.* 2015.02.19 වැනි දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ;

*06.* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

07. සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 පෙබරවාරි මස 27 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල, හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-421

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.